ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ	බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
දිනය	2012-12-12

**මහ බැංකු අධිපති කබ්රාල් බැංකුකරුවන් සඳහා කරුණු 21 ක සැළැස්මක් ඉදිරිපත් කරයි**

මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල්, බැංකුකරුවන් විසින් 2013 වසරේ සිට අවධානය යොමු කළයුතු කාර්යයන් ඇතුළත් ලේඛනයක්, 2012 දෙසැම්බර් 12 දින පැවති බැංකු අධ්‍යක්ෂවරුන්ගේ සම්මන්ත්‍රණයේදී එළිදක්වන ලදී.

1) දේශීය හා ජාත්‍යන්තර සාර්ව ආර්ථික සාධකයන් සම්බන්ධව අඛණ්ඩව දැනුවත්ව සිටීම
2) මහ බැංකුව විසින් නිකුත් කරන සියළුම නියාමන විධානයන් නොවලහා පිළිපදින බව සහතික කරගැනීම
3) වර්තමානයේ මෙන්ම අනාගතයේ බැංකුවල ප්‍රාග්ධනයේ ප්‍රමාණාත්මතාව පිළිබඳව විමසිල්ලෙන් සිටීම
4) විශේෂයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාමාර්ග, ඉහළ කළමනාකාරීත්වයේ කටයුතු සහ නියාමන අවශ්‍යතාවයන් වෙත සිදුකරන ප්‍රතිචාර පිළිබඳවද සළකමින්, සාංගමික පාලනය පිළිබඳව දැඩි අවධානයක් යොමුකිරීම
5) විකාශනය වන ආර්ථිකයේ නව බැංකු ප්‍රවර්ධනයන්ට සූදානම් වීම සඳහා කාර්ය මණ්ඩලය අඛණ්ඩව පුහුණු කිරීම
6) නව ව්‍යාපාර මට්ටම්වලට ගැලපෙන ලෙස තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීම
7) අවදානම් කළමනාකරණ පද්ධතීන් වැඩිදියුණු කිරීම හා තනි තනිව සිදුවන සිද්ධීන්ට නොව, දේශීය හා ජාත්‍යන්තර උපනතීන්ට වැඩි අවධානයක් යොමුකිරීම
8) සාංගමික සැළසුම් සකස් කිරීමේ සංස්කෘතියක් වර්ධනය කිරීම සහ ඒවා මනාව ක්‍රියාත්මක කිරීම
9) බැංකුව ව්‍යාපාර සමූහයකට අයත් වේ නම් හෝ එයට ආශ්‍රිත සමාගම් තිබේ නම් සාමූහික අවදානම පිළිබඳව අවබෝධයෙන් සිටීම

10) ‘ඔබේ ගණුදෙනුකරු හඳුනාගැනීමේ’ තොරතුරු ක්‍රමවත්ව යාවත්කාලීන කර ගනිමින්, බැංකුවේ ජාත්‍යන්තර සබඳතා සහ ව්‍යාපාරික හවුල්කරුවන් පිළිබඳව විමසිල්ලෙන් සිටීම

11) සෑම වසරකම අඩුම තරමේ එක් ශ්‍රේණියකින් වත්, බැංකුවේ ණය ශ්‍රේණිය ඉහළනැංවීමට කටයුතු කිරීම

12) ආයෝජනය, බැංකුකරණය, පුද්ගලික බැංකුකරණ සේවා, ගාස්තු මත සේවා සැපයීම වැනි නව ව්‍යාපාරික අවස්ථාවන් ගැන සළකා බලමින්, නව බැංකු සේවා ක්‍රමයෙන් හඳුන්වා දීම

13) කළමනාකාරීත්වයේ අනුප්‍රාප්තීන් පත්කිරීම විශේෂිත ප්‍රයත්නයක් ලෙස නොසලකා, සාමාන්‍ය කටයුත්තක් ලෙස ඒ සඳහා සැළසුම් කිරීම

14) කාර්යක්ෂමතාවය ඉහළනැංවීමේ මාර්ගයන් පිළිබඳව නිරන්තරයෙන් සෝදිසියෙන් සිටීම සහ ලාභදායීත්වය යහපත්ව පවත්වා ගැනීම සඳහා පොලී ආන්තිකයන් ශක්තිමත් කිරීම

15) ‘පංචමහ කේන්ද්‍රයන් සහ සංචාරක ව්‍යාපාරය’ යන අංශයන්ට අරමුදල් සම්පාදනය දිරිමත් කිරීම

16) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය කෙරෙහි අවධානය පවත්වාගැනිම සහ 2013 අයවැයෙන් එම ක්ෂේත්‍රය සඳහා දක්වන ලද අනුග්‍රහයන් ඵලදායී ලෙස භාවිතා කිරීම

17) යවන්නා සහ ලැබෙන්නා යන අංශ දෙකම ඇතුළත්ව, විදේශ විනිමය ප්‍රේෂණ කටයුතුවලට සහායවීම

18) විශේෂයෙන් උතුරු, නැගෙනහිර හා ඌව පළාත් ඇතුළත්ව පසුගාමී පළාත්වල ආර්ථික වර්ධනයට දායකවීම

19) ශේෂ පත්‍රයේ ශක්තිමත්භාවය කාර්යක්ෂම ලෙස උපයෝගී කරගනිමින්, බැංකුවෙහි පළමු පෙළ සහ දෙවන පෙළ ප්‍රාග්ධනය සඳහා විදේශ ප්‍රභවයන්ගෙන් අරමුදල් ලබාගැනීම

20) 2013 අයවැය මගින් හඳුන්වා දෙන ලද නව විනිමය පාලන ලිහිල් කිරීම් උපරිම ලෙස යොදා ගනිමින්, රටේ පවත්නා ඉතුරුම් පරතරය පියවීම සඳහා බැංකු ගණුදෙනුකරුවන් වෙත විදේශ ප්‍රාග්ධන ගලාඒම් ප්‍රවර්ධනය කිරීම

21) දේශීය ව්‍යවසායකයන් සඳහා අනුග්‍රහය දැක්වීම සහ ව්‍යාපාරික ලොවේ අනාගත නායකයන් බිහි කිරීම